සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

### 11 ශ්‍රේණිය

## ශිල්ප කලා - I පත්‍රය

නම/විභාග අංකය :- .................................................................. කාලය : පැය 01 යි.

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(1) කාර්මික විප්ලවයෙන් පසුව නවීන තාක්ෂණය සමග මුසු වී කර්මාන්තයක් බවට පත්ව ඇති ජන කලාවන් විය හැක්කේ,
(i) ලී කෙළි නැටුම්, ලී කැටයම් කලාව. (ii) ශාන්තිකර්ම, ලාක්ෂා කර්මාන්තය.
(iii) රේන්ද කර්මාන්තය, මැටි කර්මාන්තය. (iv) ශාන්තිකර්ම, පිත්තල කර්මාන්තය.

(2) සිලින්ඩරයක වක්‍ර පෘෂ්ඨය විකසනය කළ පසු දක්නට ලැබෙන්නේ,
(i) සමචතුරස්‍රාකාර තලයකි. (ii) ඍජුකෝණාස්‍රාකාර තලයකි.
(iii) චතුරස්‍රාකාර තලයකි. (iv) වෘත්තාකාර තලයකි.

(3) වෘත්තයක් තුළ යම්කිසි බහුඅස්‍ර නිර්මාණය කිරීමේ පොදු ක්‍රමයේදී
(i) වෘත්තයේ අරය හෝ විෂ්කම්භය දී තිබිය යුතුයි. (ii) වෘත්තයේ පරිධිය දී තිබිය යුතුයි.
(iii) වෘත්තයේ කේන්ද්‍රය දී තිබිය යුතුයි. (iv) ෂඩස්‍රයේ පාදයක දිග දී තිබිය යුතුයි.

(4) ඉලිප්සයක් නිර්මාණය කිරීමට යොදා ගන්නා එක් ක්‍රමයක් විය හැක්කේ කුමක්ද?
(i) ඍජුකෝණාස්‍ර ක්‍රමය. (ii) සමචතුරස්‍රාකාර ක්‍රමය.
(iii) වෘත්ත ක්‍රමය. (iv) නාභි ක්‍රමය.

(5) පහත පිළිතුරු අතරින් ඇල සමාන්තරාස්‍ර ඇතුළත් පිළිතුර තෝරන්න.
(i) සමචතුරස්‍රය, ඍජුකෝණාස්‍රය (ii) රොම්බසය, රොම්බාභය
(iii) රොම්බාභය, සමචතුරස්‍රය (iv) රොම්බසය, ඍජුකෝණාස්‍රය

(6) ස්වභාවිකව අමු රෙදි වල පවතින දුඹුරු පැහැය ඉවත්කර සුදු පැහැය ලබා ගැනීම සඳහා සිදු කරන්නා වූ රසායනික ක්‍රියාවලිය කුමක්ද?
(i) මලහරණය (ii) කැඳහරණය (iii) විරංජනය (iv) කාබනීකරණය

(7) බ්‍රිස්ටල් බෝඩ් වැනි ඝන කඩදාසි මත සැකසූ සිදුරු තහඩු මෝස්තර වල කල්පැවැත්ම ඇති කර ගැනීම සඳහා කළ යුත්තේ කුමක්ද?
(i) ෆැබ්රික් පේන්ට් ආලේප කිරීම. (ii) වාර්නිෂ් හෝ බයින්ඩර් ගම් ආලේප කිරීම.
(iii) කෙම්පික්ස් ආලේප කිරීම. (iv) සෝඩියම් කාබනේට් ආලේප කිරීම.

(8) ස්වභාවික කෙඳි අතර ශාකයේ කඳ කොටසින් කෙඳි ලබාගන්නා ශාකයක් විය හැක්කේ කුමක්ද?
(i) ජුට් (ii) සිසල් (iii) හණ (iv) පෙනා

(9) රුවල් රෙදි, නැව් කඹ ආදිය සෑදීමට යොදා ගනු ලබන ශාක විශේෂයකි.
(i) හණ (ii) නියඳ (iii) ජුට් (iv) මැනිලා

(10) ඇන්ඩීස් කඳුවල බර ගෙන යාම සඳහා උපයෝගී කර ගන්නා සත්ත්වයෙකි.
(i) ඔටුවා (ii) ලාමා (iii) ඇල්පකා (iv) ඇංගෝරා එළුවා

(11) මැහුම් ක්‍රමයක් වන ඇප්ලික් ක්‍රමයට සමාන මෝස්තර ලබාගත හැකි පිළි අලංකරණ ක්‍රමයක් වනුයේ,
(i) පැච්වර්ක් ක්‍රමය (ii) තාප බන්ධන ක්‍රමය (iii) නෙට්වර්ක් ක්‍රමය (iv) ගැටපඩු ක්‍රමය

(12) පෝස්ටර්, දැන්වීම්, ආරාධනා පත්‍ර ආදිය මුද්‍රණය කිරීම සඳහා වඩා සුදුසු මුද්‍රණ ක්‍රමය වන්නේ,
(i) අච්චු මුද්‍රණ ක්‍රමය (ii) ස්ටෙන්සිල් මුද්‍රණ ක්‍රමය
(iii) තිර රාමු මුද්‍රණ ක්‍රමය (iv) ගැටපඩු ක්‍රමය

(13) සේද රාමු මුද්‍රණ ක්‍රමයේදී රාමුවේ තිරය සඳහා භාවිතා කළ හැකි රෙදි වර්ගයකි.
(i) කපු රෙදි (ii) පොප්ලින් රෙදි (iii) ඕගන්ඩි රෙදි (iv) ටෙරලින් රෙදි

(14) බතික් වර්ණ ගැන්වීම සඳහා වඩාත් සුදුසු රෙදි වර්ග අයත් කාණ්ඩය තෝරන්න.
(i) සේද, ලිනන් (ii) ලෝම, රේයෝන් (iii) පොප්ලින්, සේද (iv) පොප්ලින්, මල්පීස්

(15) බතික් ක්‍රමයේදී මෝස්තරය සඳහා අඛණ්ඩ රේඛා ලබා ගැනීම සඳහා කළ යුත්තේ කුමක්ද?
(i) මී ඉටි ප්‍රමාණය වැඩි කළ යුතුය. (ii) මී ඉටි ප්‍රමාණය අඩු කළ යුතුය.
(iii) රටදුම්මල ප්‍රමාණයේ අනුපාතය වැඩි කළ යුතුය. (iv) රටදුම්මල හා මී ඉටි අනුපාතය වැඩි කළ යුතුය.

(16) නූල් අංක 30ˢ කිලෝග්‍රෑමයක දිග මීටර් කීයද?
(i) 1000 x 30 = මීටර් 30,000 කි. (ii) 1000 x 15 = මීටර් 15,000 කි.
(iii) 1000 x 3 = මීටර් 3,000 කි. (iv) 1000 x 60 = මීටර් 60,000 කි.

(17) අංක 10ˢ තනිපට නූලක් දෙපට අඹරා ගත් විට එහි අංකය 2/10 ˢ වේ. ඒ අනුව කිලෝග්‍රෑම් 1 ට අල්ලන නූල් කැරලි ගණන කීයද?
(i) 10 කි. (ii) 5 කි. (iii) 20 කි. (iv) 15 කි.

(18) අංක 30ˢ තනිපට නූලක් තුන්පට අඹරා ගත් විට එහි අංකය 3/30 ˢ වේ. ඒ අනුව කිලෝග්‍රෑම් 1 ට අල්ලන නූල් කැරලි ගණන කීයද?
(i) 30 කි. (ii) 15 කි. (iii) 10 කි. (iv) 60 කි.

(19) සෙන්ටිමීටරයකට දික් නූල් 30 ක් ඇති ඇඳ රෙදි හැදයක පළල සෙ.මී. 90 කි. එම හැදයේ ඇති දික්නූල් සංඛ්‍යාව කීයද?
(i) 2700 කි. (ii) 27, 000 කි. (iii) 270 කි. (iv) 2,70,000 කි.

(20) දිග මීටර් 50 ක් හා සෙන්ටිමීටරයට දික් නූල් 30 ක් ඇති ඇඳ රෙදි හැදයක පළල සෙ.මී. 90 කි. එම හැදයේ ඇති දික් නූල් සංඛ්‍යාවේ දිග කීයද?
(i) 50 x 90 = මීටර් 4500 කි. (ii) 50 x 90 x 30 = මීටර් 13, 500 කි.
(iii) 50 x 30 = මීටර් 1500 කි. (iv) $\frac{50 \times 90}{30}$ = මීටර් 150 කි.

(21) මේස දරණු, ඉන පටි, ලේන්සු වැනි පළලින් අඩු රෙදි වියා ගැනීම සඳහා යොදා ගත හැකි විවීමේ යන්ත්‍රයකි,
(i) චාම් යන්ත්‍රය (ii) ජව නඩා යන්ත්‍රය (iii) මේස යන්ත්‍රය (iv) බලවේග යන්ත්‍රය

(22) නූල් හැදය වියා අවසන් වන තෙක් හැදය රඳවා තබා ගන්නේ ජවනඩා යන්ත්‍රයේ කුමන යන්ත්‍ර කොටස ආධාරයෙන්ද?
(i) වටකඳ (නූල් කඳ) (ii) පිළිකඳ (iii) ඔරොත්තු කඳ (iv) උරකඳ

(23) හරස් නූල් තද කර රෙද්ද වියා ගැනීමට උපකාරී කර ගන්නා උපාංගයකි,
(i) ලීවර (ii) ඇව්ව (iii) හරස් පොලු (iv) පාපොලු

(24) නූල් එතීමේ උපකරණ කට්ටලයට අයත් එතුම් රෝදයෙන් ඇති ප්‍රයෝජනයක් වන්නේ,
(i) නූල් මල රඳවා ගැනීම.
(ii) දික් නූල් කුරු වලට හා හැඩ නූල් කුරු වලට දික් හරස් නූල් ඔතා ගැනීම.
(iii) දික්නූල් කුරු අසුරා තබා ගැනීම.
(iv) කපු නූල් කැටීම සඳහා යොදා ගැනීම.

(25) දිගින් හා පළලින් අඩු කුඩා ප්‍රමාණයේ නූල් හැදයක් දික් ගැසීම සඳහා භාවිතා වන උපකරණයකි,
(i) දික් නූල් කුරු රාක්කය.
(ii) නූල් බෙන්ම.
(iii) දික් ගසන ලෑල්ල.
(iv) නූල් බෙරය.

(26)



(i) (ii) (iii) (iv)

ඉහත දක්වා ඇති රූප සටහන් අතරින් දාගරහීරි වියමන තෝරන්න.

(27) දියමන්තියක හැඩය මතු කරමින් හීරි රේඛාව ගමන් කරන්නේ කුමන වියමන් ක්‍රමයේදී ද?
(i) තුඩුහීරි වියමනේදී
(ii) විසිතුරු හීරි වියමනේදී
(iii) රුවිතහීරි වියමනේදී
(iv) සංයෝජිත හීරි වියමනේදී

(28) අලංකාර, බර වැඩි රෙදි වර්ග නිපදවා ගැනීම සඳහා යොදා ගත හැකි වියමනක් වන්නේ
(i) තුඩුහීරි (ii) කඩහීරි (iii) රළහීරි (iv) රුවිතහීරි

(29) මූලික විවීමේ රටා අතරින් දෙවැනි වියමන් රටා ප්‍රභේදය වන්නේ,
(i) වාම් (ii) සැටින් (iii) හීරි (iv) සරලහීරි

(30) හැදයක සීරු දැමීම සඳහා භාවිතා කරන උපකරණය වන්නේ,
(i) දික් ගසන ලෑල්ල (ii) නූල් බෙරය (iii) දික් නූල් කුරු රාක්කය (iv) නූල් බෙන්ම

(31) ශේෂ මැටි, පිහිටි මැටි යන නම් වලින් හඳුන්වනු ලබන මැටි වර්ගය කුමක්ද?
(i) ප්‍රාථමික මැටි (ii) ද්විතියික මැටි (iii) අගම් මැටි (iv) තලප මැටි

(32) යකඩ ප්‍රතිශතය ඉතාමත් සුළු වශයෙන් අඩංගු වී ඇත. මැටි පැහැදිලි සුදු වර්ණයෙන් දිස් වේ. පිලිස්සීමෙන් පසු ද සුදු පැහැයක් ගනී.
ඉහත ලක්ෂණ අඩංගු වී ඇති මැටි වර්ගය කුමක්ද?
(i) බෝල මැටි (ii) මකුළු මැටි (iii) කෙඔලින් (iv) මයිකාමය මැටි

(33) සුවිකාර්යතාවය අඩු මැටි වලට අවශ්‍ය නම්‍යතාව ඇති කර ගැනීම සඳහා කළ යුත්තේ කුමක්ද?
(i) කෙඔලින් මැටි මිශ්‍ර කර ගත යුතුය.
(ii) තලප මැටි එක් කර ගත යුතුය.
(iii) රතු මැටි එක් කර ගත යුතුය.
(iv) ගිනි මැටි එක් කර ගත යුතුය.

(34) මැටි භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා නොඇලෙනසුලු අමුද්‍රව්‍යයකි,
(i) ඩොලමයිට් (ii) කෙඔලින් (iii) රතු මැටි (iv) බෙන්තොනයිට්

(35) සකපෝරුව ආධාරයෙන් මැටි භාණ්ඩයක් ඉදි කිරීමේදී එහි පළමු පියවර වශයෙන් කළ යුත්තේ කුමක්ද?
(i) මැටි පිඩ මධ්‍යගත කිරීමයි.
(ii) පදම් කරගත් මැටි පිඩ සකපෝරුව මත සවි කිරීමයි
(iii) අවශ්‍ය වයනය ලබා ගැනීමයි.
(iv) මැටි පිඩ විවෘත කිරීමයි.

(36) විනිවිද නොපෙනෙන ඔප මිශ්‍රණ භාවිත කරමින් නිෂ්පාදනය කරන භාණ්ඩයක් වන්නේ
(i) සනීපාරක්ෂක භාණ්ඩ (ii) පෝසිලේන් භාණ්ඩ
(iii) විදුලි උපාංග (iv) සෙවිලි උළු

(37) නිදුල තටු පිලිස්සීම හෙවත් බිස්කට් පිලිස්සීම යනු කුමක්ද?
(i) සෙරමික් භාණ්ඩ පළමු පිලිස්සීමට භාජනය කිරීමය.
(ii) සෙරමික් භාණ්ඩ දෙවන පිලිස්සීමට භාජනය කිරීමය.
(iii) ඉහළ උෂ්ණත්වයකට පිලිස්සීමය.
(iv) පහළ උෂ්ණත්වයකට පිලිස්සීමය.

(38) ඩෙකෝපාජ් ක්‍රමයට මැටි භාණ්ඩ අලංකාර කිරීමේදී කළ යුත්තේ
(i) වර්ණ කඩදසි ඉරා අලවා ගැනීමයි.
(ii) සඟරාවකින් හෝ කැලැන්ඩරයකින් කපා ගත් රූපයක් භාණ්ඩය මත අලවා ගැනීමයි.
(iii) කඩදාසි පල්ප භාවිත කර හැඩතල නිර්මාණය කර භාණ්ඩය මත ඇලවීමයි.
(iv) කොන්ක්‍රීට් මිශ්‍රණයෙන් සකස් කරගත් හැඩතල භාණ්ඩය මත ඇලවීමයි.

(39) හම් පදම් අවස්ථාවේදී, මැටි භාණ්ඩ සඳහා භාවිත කළ හැකි අලංකරණ ක්‍රමයකි.
(i) සායම් සීරුම් රටා යෙදීම. (ii) පින්සල් මගින් සායම් ආලේපනය
(iii) සායම් වක් කිරීම. (iv) සායම් ගිල්ලවීම.

(40) ඊරි පටපණුවා ආහාරයට ගන්නේ,
(i) මල්බෙරි කොළය (ii) ඕක් කොළය (iii) රට එඬරු කොළය (iv) ඔලිව් කොළය

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 11 ශ්‍රේණිය

## ශිල්ප කලා - II පත්‍රය

නම/විභාග අංකය :- ..............................................................................  කාලය : පැය 02 යි.

❖ අනිවාර්ය පළමු ප්‍රශ්නයද තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(1) ''පුංචි අපි ලොවේ හපන්නු'' යන තේමාව යටතේ උත්සවයක් පැවැත්වීමට දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇත. මෙහිදී පාසල් දරුවන්ගේ නිර්මාණ හැකියාවන් එළි දැක්වීමට මෙන්ම ප්‍රදර්ශනයක්, අලෙවිකරණයක් හා නිර්මාණ අගයා තෑගි හා සහතික පත් ප්‍රදානය කිරීමටද අදහස් කර ඇත.

(i) මෙම උත්සව භූමියට ගමන් කිරීමට ඇති මාර්ගය අලංකරණයට යොදාගත් ක්‍රමවේද 2ක දළ සටහන් අඳින්න.
(ii) තොරණ ඉදිකිරීමට අවට පරිසරයෙන් යොදාගත් අමුද්‍රව්‍ය 4 ක් නම් කරන්න.
(iii) ආරාධිතයන් පිළිගැනීමට සුදුසු මල් කළඹක දළ රූප සටහනක් ඇඳ ඒ නිර්මාණයට යොදාගත් ද්‍රව්‍ය නම් කරන්න.
(iv) අතින් පින්තාරු කිරීමේ ක්‍රමය යටතේ නිර්මාණ ප්‍රදර්ශනයට ඉදිරිපත් කර තිබූ නිර්මාණ 4 ක් නම් කරන්න.
(v) සකපෝරුව ආධාරයෙන් නිර්මාණය කර වෙළෙඳ ප්‍රදර්ශනයට තබා ඇති භාණ්ඩ 4ක් නම් කරන්න.
(vi) ප්‍රදර්ශන කුටියක අත් පිස්නා රාශියකි. ඉන් ජටා වියමන යොදා කරන ලද නිර්මාණ බොහෝ ය. ජටා වියමන් මෝස්තරය ප්‍රස්තාරගත කර පෙන්වන්න.
(vii) ආරාධිත අමුත්තන් සඳහා සංග්‍රහයක් කිරීමට කිරිබත් බන්දේසියක් විය. එහි කිරිබත් රොම්බසයක හැඩයට කපා තිබුණි. රොම්බසයක් නිර්මාණය කරන්න.
(viii) සංග්‍රහ කමිටු සාමාජිකයන් හඳුනා ගැනීම සඳහා තිල ලාංඡනයක් අඳින්න.
(ix) රෙදි කැබලි ආශ්‍රිතව අලංකාර කොට්ට උර රාශියක් අලෙවි සැල්වල විය. පැච්වර්ක් ක්‍රමයට සකස් කර ගැනීමට හැකි මෝස්තරයක් නිර්මාණය කරන්න.
(x) දරුවන්ට තෑගි බෙදාලීමට සුදුසු අත්බෑගයක හැඩයක් ඇඳ දක්වන්න. (ලකුණු 20)

(2) (i) සිලින්ඩරාකාර බෝනික්කා සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ 06 ක් නම් කරන්න. (ලකුණු 3)
(ii) පතුලේ විෂ්කම්භය 4cm සහ 5cm වන සිලින්ඩරයේ විකසනය අඳින්න. (ලකුණු 3)
(iii) සිලින්ඩරාකාර හැඩයෙන් යුත් අත් බෑගයක රූප සටහනක් අඳින්න. එම අත් බෑගය සකස් කරන ආකාරය පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න. (අභිමත මිණුම් භාවිත කරන්න) (ලකුණු 4)

(3) (i) සේද රාමු මුද්‍රණයේදී භාවිතා කරන රාමුවක තිබිය යුතු ගුණාංග 3ක් නම් කරන්න. (ලකුණු 3)
(ii) රාමුවේ තිරය සඳහා භාවිතා කළ හැකි රෙදි වර්ග 3ක් නම් කරන්න. (ලකුණු 3)
(iii) වයස අවුරුදු 8 - 10 අතර කුඩා පිරිමි දරුවෙකුගේ ටී ෂර්ටයක් සඳහා ගැළපෙන තිර රාමු මුද්‍රණයකට සුදුසු නිර්මාණයක් ඇඳ වර්ණ කරන්න. (ලකුණු 4)

(4) අත් යන්ත්‍රයක් ආධාරයෙන් අත් පිස්නා ප්‍රමාණයක් වියා ගැනීමට අපේක්ෂා කෙරේ ඒ සඳහා සකස් කරන ලද නූල් හැදයක දත්ත මෙහි දැක්වේ.

* හැදයේ දිග මීටර් 50
* හැදයේ පළල මීටර් 90
* සෙන්ටිමීටරයකට දික් නූල් පොටවල් 30
* නූල් නොම්මරය $2/30^{s}$
* නූල් වර්ණය ලා කහපාටය.
* නූල් 1kg ක මිල රු. 300 කි.

(i) හැදය සඳහා අවශ්‍ය නූල් ප්‍රමාණය කැරලි වලින් සොයන්න. (ලකුණු 3)
(ii) මෙම හැදය සඳහා වැයවූ මුළු නූල්වල බර කොපමණද? (ලකුණු 3)
(iii) මෙම නූල් හැදය වියා අවසන් කිරීමට වැය වූ මුදල කොපමණද? (ලකුණු 4)

(5) ඇඳුම් මිනිසාගේ මූලික අවශ්‍යතාවයකි. අධික ජනගහනය සඳහා වේගවත් අවශ්‍යතාවයන් ඇති නිසා විවිධ යන්ත්‍ර සූත්‍ර බිහි කරමින් පේෂ කර්මාන්තය මහා පරිමාණ කර්මාන්තයක් බවට පත්ව ඇත.

(i) රෙදි වියීම සඳහා භාවිත වන යන්ත්‍ර 3 නම් කරන්න. (ලකුණු 3)

(ii) ජවනඩා යන්ත්‍රයක (අත් යන්ත්‍රයක) උපාංග 6 නම් කරන්න. (ලකුණු 3)

(iii) පනාව, ලීවර, සීරු දැමීම පිළිබඳ කෙටි සටහන් ලියන්න. (ලකුණු 4)

(6) වියීමේ සාම්ප්‍රදායික රටා අතර වාම් වියමන මූලික වියමන් රටාවක් ලෙස සැලකේ.

(i) වාම් වියමන් රටාවේ ප්‍රභේද 4 නම් කරන්න. (ලකුණු 3)

(ii) රේඛා කැඩීමෙන්, ඇල කිරීමෙන්, හැරවීමෙන් හිරි වියමන් විශේෂිත නම් වලින් හඳුන්වයි. එම හිරි රටා වියමන් 6 නම් කරන්න. (ලකුණු 3)

(iii) ඔබ කැමති ඕනෑම හිරි වියමන් රටාවක් ප්‍රස්තාරගත කරන්න. (ලකුණු 4)

(7) සකපෝරු භාවිතයෙන් නිර්මාණය කරන විවිධ භාණ්ඩ වෙළෙඳ පොළේ දැකිය හැකිය.

(i) භාණ්ඩ නිපදවීමට යොදා ගන්නා සකපෝරු වර්ග කීයද? ඒ මොනවාද? (ලකුණු 3)

(ii) සකපෝරුවක මැටි භාණ්ඩ ඉදි කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය 6 නම් කරන්න. (ලකුණු 3)

(iii) සකපෝරුවක මැටි භාණ්ඩ ඉදි කිරීමේ පියවර අනුපිළිවෙල කෙටියෙන් ලියන්න. (ලකුණු 4)